[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

**දෙවන වාර ඇගයීම - 2023**

| 11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය - | I පත්‍රය | පැය 01 |
|---|---|---|---|

නම - ..............................................................................................................

**සැලකිය යුතුයි.**

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවලදී ඇති 1, 2, 3, 4 යන පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුර පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

01. රාග ජාතියට අනුව සම්පූර්ණ වර්ගයට අයත් නොවන රාගය කුමක්ද ?

1.යමන් 2.කාෆි 3.භූපාලි 4.භෛරවී

02. රාත්‍රී ප්‍රථම ප්‍රහාරයේ ගැයෙන රාග යුගලයක පොදු ලක්ෂණයකි.

1.ගාන්ධරය වාදී වේ. 2.ධෛවතය සංවාදී වේ.

3.සම්පූර්ණ ජාතී වේ. 4.ශුද්ධ ස්වර පමණක් යෙදේ.

03. ෂඩ්ජය සංවාදී ස්වරය වන රාග යුගලයකි.

1.කාෆි, බිලාවල් 2.භෛරවී, කාෆි 3.භෛරවි, යමන් 4.බිලාවල්, භෛරවී

04. රාගයක් බිහිවන්නෙ මේලයකින් බවත් උතුරු ඉන්දියානු හින්දුස්ථානී සංගීතයේ මේල දහයක් භාවිතා වන බවත් පෙන්වා දුන්නේ,

1.අමීර් කුෂ්රු 2.රවි ශංකර් 3.ශකීර් හුසේන් 4.භාත්ඛණ්ඩේ

05. රාගයක කිසිවිට අත් නොහරින ස්වරයක් වනුයේ,

1.සඞ්ජය 2.රිෂභය 3.මධ්‍යමය 4.පංචමය

06. සාදු දන්තදා ගීතයේ නාද මාලාව ඇසුරු කර ඇති රාගය කුමක්ද ?

1.බිලාවල් 2.භූපාලි 3.යමන් 4.කාෆි

07. ස රි ම ප නි අනුවාදී ස්වර ලෙස යෙදෙන රාගය වනුයේ,

1.බිලාවල් 2.යමන් 3.කාෆි 4.භූපාලි

08. භෛරවී රාගයේ මුඛ්‍යාංගය තෝරන්න.

1. ම ගු ස රි ස ධු නි ස 2.ම ගු ස ධු නි ප ධු ස 3.ස රි ගු ම ගු රි ස 4.ධු ම ධු නි ස් රි් ස්

09. සරි ගග රිග පප | ගප ධධ පධ ස්ස් මෙය කුමන වර්ගයට අයත් තානාලංකාරයක්ද ?

1.සරල තාන් 2. අලංකාරික තාන් 3.බෝල් තාන් 4.මිශ්‍ර තාන්

10. නිදේර්ශිත රාග අතුරින් විකෘති ස්වර එකක් හා දෙකක් වශයෙන් යෙදෙන රාග යුගලය පිළිවෙළින්,

1.කාෆි හා භෛරවී වේ. 2.කාෆි හා යමන් වේ. 3.යමන් හා කාෆි වේ. 4.යමන් හා භෛරවී වේ.

- අංක 11 සිට 14 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සැපයිම සඳහා පහත සඳහන් ගී පාදය උපයෝගී කරගන්න.

පිපෙන | මල්මත| බඹරු| වහලා S

11. මෙම ගී පදය ගැයීමට සුදුසු හින්දුස්ථානී තාලය කුමක්ද ?

1.ත්‍රිතාලය    2.දාදරා තාලය    3.ජප් තාලය    4.දීප්චන්දි තාලය

12.දෙවන හා සිව්වන විභාගවල එක් මාත්‍රාව බැගින් අඩු කළ විට ලැබෙන තාලය නම් කරන්න.

1.කෙහෙවර්ා තාලය    2.ජප් තාලය    3.දීප්චන්දි තාලය    4.දාදරා තාලය

13. පිපෙනා මල්පත බඹරුන් වහලා යනුවෙන් පදමාලාව වෙනස් වූ විට උචිත තාලය කුමක්ද ?

1.කෙහෙවර්ා තාලය    2.ජප් තාලය    3.දීප්චන්දි තාලය    4.දාදරා තාලය

14.මුලින් දක්වා ඇති ගී පාදයේ ඇති සියළුම විභාග කොටස්වලින් මාත්‍රාව බැගින් ඉවත් කළ විට ලැබෙන තාලය නම් කරන්න.

1.දාදරා තාලය    2.ජප් තාලය    3.කෙහෙවර්ා තාලය    4.දීප්චන්දි තාලය

- පහත දක්වා ඇත්තේ ඔබගේ විෂය නිදෙර්ශයට අයත් ගායනා කිහිපයකට අදාළ තොරතුරු වේ. ඒ ඇසුරින් අංක 15 සිට 20 දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - කවිකාර මඩුවේදී ගායනා කර ඇත.
  - කණර්ාට සංගීතය භාවිතා කර ඇත.
  - සේ ගී වලට අයත් වේ.
  - ගැටබෙරය තාල වාදනය සඳහා යොදා ගෙන ඇත.

15. ඉහත තොරතුරු සියල්ල ම පොදුවේ දැකිය හැකි ගායනා විශේෂ තුනකි.

1.වන්නම් හටන් ප්‍රශස්ති    2.ප්‍රශස්ති නාඩගම් හටන්

3.හටන් සිංදුවන්නම් ප්‍රශස්ති    4.ප්‍රශස්ති සිංදුවන්නම්, නාඩගම්

16. නොමදින් විකුම් පාලා............ මෙම ගී ඇතුළත් ගී විශේෂය වනුයේ,

1.වන්නම්    2.ප්‍රශස්ති    3.හටන්    4.නූතර්ී

17. මෙම ගායනාවල තනු නිමර්ාණයට දායක වූ සංගීතඥයෙකි.

1.අලගනායිඩු    2.විශ්වනාත් ලව්ජී    3.අමීර් කුෂ්රු    4.ගණිතාලංකාර

18. මුද්‍රප්පදය නම් සංගීතාංගය ඇතුළත් ගී විශේෂය නම් කරන්න.

1.ප්‍රශස්ති    2.වන්නම්    3. හටන්    4. නාඩගම්

19. කස්තිරම, සීරුමාරුව, අඩව්ව යන පද භාවිතා වන්නේ මෙම යුගයේ රචිත කිනම් ගායනා ඇසුරින්ද ?

1.ප්‍රශස්ති    2.වන්නම්    3.නාඩගම්    4.හටන්

20. ප්‍රශස්ති ගායනා ඇසුරෙන් නිමර්ාණය කරන ප්‍රකට ගීතයක් වනුයේ,

1.සිරි ලංකා රජින්දා වේ    2.රුක් අත්තන මල මුදුනේ

3.තෙදිනි විරාජ    4.වගුරට නරනිඳු


21. කොබෝ S | කුරුලු | වනේ S | S S S   මෙම කවි පාදයේ සදැස්මත් හා ගී මත් ගණන ලියන්න.

1.9,12 කි.    2.10, 12 කි.    3.7,9 කි.    4.7, 12 කි.

22. විෂම ග්‍රහයෙන් ගැයෙන ගීතයකට උදාහරණයකි.

1.ලංකා ලංකා පෙම්බර ලංකා    2.සසර වසන තුරු

3.රත්න දීප ජන්ම භූමි    4.හෙළ ජාතික අභිමානේ




23. ඉහත A සහ B රූප සටහන් දෙකෙහි පිළිවෙලින් දක්වා ඇත්තේ,

1.අඩු තාරතාවයක් ඇති නාදයක සහ වැඩි තාරතාවයක් ඇති නාදයක චලන රටාවේ.

2.වැඩි තාරතාවක් ඇති නාදයක සහ අඩු තාරතාවක් ඇති නාදයක චලන රටාවේ.

3.අඩු විපුලතාවක් ඇති නාදයක සහ වැඩි විපුලතාවක් ඇති නාදයක චලන රටාවේ.

4.වැඩි විපුලතාවක් ඇති නාදයක සහ අඩු විපුලතාවක් ඇති නාදයක චලන රටාවේ.

24. ඩබ්.බී. මකුළොලුව මහතා විසින් සංගීත ක්ෂේත්‍රයට එකතු කළ ග්‍රන්ථය,

1.සිංහල ගැමි නාටකය　　2.පෙරදිග සංගීත ශාස්ත්‍රය

3.හභාවිත ගීත　　4.හෙළ ගී මග

25. රංග විසින් වයලීනයේ D3 තතෙහි දබරැඟිල්ල අංක 01 ලෙස ද මැදඟිල්ල අංක 02 ලෙස ද වෙදැඟිල්ල 2 අංක 03 ලෙසද නම් කර බිලාවල් රාගය වැයීමේදී අංක 03, 02, 03, 01 වශයෙන් වාදන කරන ලද්දේ කිනම් ස්වර විය හැකිද ?

1.ග රි ස රි　　2.ම රි ග රි　　3.ග ප ම ග　　4.ම ග ම රි

26. නූතරී සංගීතය සඳහා ආභාෂය ලැබී ඇත්තේ,

1.කණර්ාය සංගීතයෙනි　　2.වංග සංගීතයෙනි

3.බටහිර සංගීතයෙනි　　4.උත්තර භාරතීය සංගීතයෙනි

27. නූතරී සංගීතය සඳහා ආභාෂය ලැබී ඇත්තේ,

1.ස්වාධීන සරල ගීත　　2.නූතරී ගීත　　3.ජන ගීත　　4.ශාස්ත්‍රිය ගීත

28. පද මාලාවක ශෝකාත්මක බව හෝ භක්තියමය රසය දැනවීම සඳහා රාගධාරී සංගීතය ආශ්‍රයෙන් තනුවක් නිමර්ාණය කිරීමට සුදුසු රාගයක් ලෙස නම් කළ හැක්කේ,

1.යමන් රාගය　　2.භෛරවි රාගය


3. බිලාවල් රාගය　　4.වණර් චක්‍ර පහන්ය.

29. විරිඳු ශෛලියේ ගීත ඇතුළත් නාට්‍ය තෝරන්න.

1.මධුර ජවනිකා　　2.රාජකපුරු

3.තවු　　4.තාරාවෝ ඉගිළෙති.

30.යම් ස්වර ඛණ්ඩයක් දෙවරක් වාදනය කලයුතු බව හඟවන Ripition එකකි.

1. //　　2.$　　3.%　　4. 

- අංක 31 සිට 35 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු පහත දැක්වෙන යන කොටස් උපයෝගී කරගනිමින් පිළිතුරු සපයන්න.

| A | B | C | D |
|---|---|---|---|
| සිරිසඟබෝ | ඉයුජින් | ජසයා | මනමේ |
| වෙසසන්තර | බැලසන්න | ලෙන්චිනා | සිංහබාහු |
| දුටුගැමුණු | බ්‍රම්මෂෝට් | මුදලි | හුණුවටය |

31. ඉහත A, B, C, D යන කොටස් නම් කළ යුතු වන්නේ,

1.A නාඩගම්, B නූතරී, C නව නාට්‍ය, D කෝලම්

2.A නූතරී, B නාඩගම්, C කෝලම්, D නව නාට්‍ය

3.A නාඩගම්, B නූතරී, C කෝලම්, D නව නාට්‍ය

4.A නූතරී, B නාඩගම්, C නව නාට්‍ය, D කෝලම්

32. B කොටසට අයත් නාට්‍යවල සංගීත නිමර්ාණයට පදනම් කරගෙන ඇත්තේ,

1.උතුරු ඉන්දියානු සංගීතය 2.කණර්ාටක සංගීතය

3.වංග සංගීතය 4.හින්දුස්ථානී සංගීතය

33.සැම චරිතයක්ම වෙස්මුහුණු පැළඳ ඉදිරිපත් කරනු ලබන රංගණය ඇතුළත් වන්නේ,

1.A කොටසය. 2.B කොටසය. 3.C කොටසය. 4.D කොටසය.

34. සපරීනාව සහ තබ්ලාව සහාය සංගීත භාණ්ඩ ලෙස භාවිත කරනුයේ,

1.A කොටසය. 2.B කොටසය. 3.C කොටසය. 4.Dකොටසය.

35. D කොටසට අයත් ගීතයකි.

1.දන්නෝ බුදුන්ගේ 2.ආල වෙලා පියසේ පටන්

3.ගම්භිර තෙදැති කොන්ස්තන්තිනුපුරේ 4.ගල් ලෙන බිඳලා

36. | සි න හ | වෙන් හෝ S | ක ථා වෙන් බෑ S| ලෙස ගැයෙන ගීතයට තාල වාදනය සඳහා සුදුසු බටහිර තාලය,

1.5/4 2.7/4 3.6/8 4.3/4

37. බටහිර සංගීතයට අනුව ඩොටඩ් මිනිම් සෙමි බ්‍රිව් සංකේත අවශ්‍ය වන්නේ පහත කුමන ගී පාදය ප්‍රස්තාර කිරිමටද ?

1.| ග ම | ප ග | ම ග රි - | 2. | ස රි | ස රි | ප - | ප -

3. | ස රි ස | රි ග රි | ග ම ග | ප ප - | 4. |ස රි ග ම | ප - - ස | නි නි ධ ධ | ප- - - |

38. F Major cord එකට අයත් ස්වර පිළිවෙලින්,

1.ම ධ ස වේ. 2.ප නි රි වේ. 3.රි ම ධ වේ. 4.ස ග ප නි වේ.

39. පල්ටා, කායදා , පරන් තිහායි යන පාරිභාෂික පද භාවිත වන්නේ කුමන භාණ්ඩයකට අදාළවද ?

1.වයලීනය 2.තබ්ලාව 3.සිතාරය 4.මද්දලය

40.නන්දා මාලනී මහත්මිය ගයන ‘‘ සරුංගලේ වරල් සැලේ‘‘ යන ගීතයට පාදක වූ රාගයේ ඇතුළත් ස්වර සංගතියකි.

1.පධ සරි ගරි ගරිග 2.ගපධනිසනිධප 3.නිධ නිරිසනිප 4.රිගුරිම ගුරිස

( ල.1 X 40 = 40)

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்வி வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

**මතුගම අධ්‍යාපන කලාපය**

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය - | II පත්‍රය | පැය 02 |
|---|---|---|---|

නම - ..........................................................................................................

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. i. පධසරිස, පධසරිගපගරිස, පධසරිගපධපගරිස යන ස්වර අභ්‍යාසය අයත් රාගය කුමක්ද ? (ලකුණු 01)

ii. හින්දුස්ථානි තාලපදයක මුල් මාත්‍රාවේ සිට අවසාන මාත්‍රාව දක්වා යේකාව වරක් වැයීම කිනම් නමකින් හඳුන්වයිද ? (ලකුණු 01)

iii. පරිඝණකය ඇසුරින් සංගීතය පටිගත කිරීම සඳහා වර්තමානයේ භාවිතා කරන මෘදුකාංගයක් නම් කරනන. (ලකුණු 01)

iv. කපිරිඤ්ඤා සංගීතය මෙරට ව්‍යාප්ත වූයේ කිනම් කාල වකවානුවකද ? (ලකුණු 01)

v. කලාසම යන අංගය භාවිත වන වන්නම් සම්ප්‍රදාය ප්‍රචලිත ප්‍රදේශය නම් කරන්න. (ලකුණු 01)

vi. ස ද වා|S සු දූ | වැ ලි පි | වි තු රු | යන ගී පාදය අයත් වන්නේ කිනම් පැදි වගර්යටද ? (ලකුණු 01)

vii. සිතාරයේ හා බටනලාවේ නාදය වෙන්ව හඳුනාගත හැකි වන්නේ නාදයේ කුමන ගුණයක් නිසාද ? (ලකුණු 01)

viii. ''රෝජා'' චිත්‍රපටයේ සංගීත නිමර්ාණකරු නම් කරන්න. (ලකුණු 01)

ix. සී ද එස්. කුලතිලක මහතා ...................................................... යන කෘතිය රචනා කරමින් සංගීතයේ උන්නතියට දායක වූ අතර ජන ගී ඇසුරින් ................................................. යන සරල ගීතයද එතුමාගේ නිමර්ාණයකි. (ලකුණු 02)

x. ලෝක ප්‍රකට සිතාර් වාදකයා ලෙස ......................................... සංගීතඥයා හැඳින්විය හැකි අතර විද්‍යුත් සංගීතය සංධ්වනි වාද්‍ය වෘන්දය සමඟ මුසු කරමින් නූතන සංගීතයේ නිමර්ාණකරුවෙකු ලෙස .......................... සංගීත ශිල්පියා හැඳින්විය හැකිය. (ලකුණු 02)

(ලකුණු 12)

02. පහත දැක්වෙන්නේ නිදෙර්ශිත රාග තුනකට අයත් ස්වර ඛණ්ඩයන්ය.

A) නි ස ග ම| ප ධ ප ම| ග ප ම ග |ග රි ස - |

B) ග ග රි| ග ම/ ප ම/ |ග රි ග රි |ස නි රි|

C) නි ධ ප ම | ග ග රි රි| රි ප ම ප| ම ග රි ස|

i. ඉහත A,B,C ස්වර පාද අයත් රාග තුන නම් කරන්න. (ලකුණු 03)

ii. මින් ඔබ කැමති ඒක රාගයක මාධ්‍යලය ගීතයක සගර්ම් ගීතයක හෝ ලක්ෂණ ගීතයක ස්ථායී කොටස පමණක් නියමිත තාල සලකුණු යොදා ප්‍රස්තාර කරන්න. (ලකුණු 05)

iii. ඔබ තෝරා ගත් රාගය හැර අනෙක් රාග දෙකෙන් එකකට අදාළව මාත්‍රා අටකට නොඅඩුවන සේ තානාලංකාර දෙකක් ලියා දක්වන්න. (ලකුණු 04)

03. පහත දැක්වෙන්නෙ නිදෙර්ශිත තාල පද කිහිපයකට අදාලවන තොරතුරුය.

| A | B |
|---|---|
| • විභාග 4 කි.<br>• මාත්‍රා 14 කි.<br>• 2 0 3 තාල සංකේත යොදයි. | • මාත්‍රා 8 කි.<br>• ''ලලිතකලා ඔප කරනා'' ගීතය වාදනයේදී යොදා ගනී.<br>• විභාග 2කි. |
| **C** | **D** |
| • මාත්‍රා 4කි.<br>• වේග රිද්ම ගීත ගැයීමට උචිතය.<br>• විභාග 2කි. | • විභාග 14කි.<br>• මාත්‍රා 16 කි.<br>• මධ්‍යලය ගීත වැයීමට සුදුසුය. |

i. ඉහත A, B, C, D කොටස්වල විස්තර අනුව තාල පද 4ක පිලිවෙලින් නම් කරන්න. (ලකුණු 04)

ii. A කොටසට අයත් තාල පදය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කරන්න. (ලකුණු 03)

iii. C කොටසට අයත් තාල පදය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්ථාර කරන්න. (ලකුණු 01)

iv. D කොටසට අයත් තාල පදයට සමාන දේශිත තිත නම් කර ඊට අදාළ බෙර පදය ප්‍රස්තාර කරන්න.

(ලකුණු 03)

04. පහත දැක්වෙනුයේ ඔබ විෂය නිදෙර්ශයට අයත් වන්නමක හා කෙළි ගීයක ගැයෙන තානමේ මුල් පාද දෙකකි.

a. තාSන තනාS | තනත තෙනාS | තෙතන තනාS | තනත තෙනාS

b. තාSන තනාS තම්දෙ S S S | නාSත මදෙනා නාSS S S S

i. a හා b යටතේ දැක්වෙන තානම සමඟ ගැයෙන කවි පාදය බැගින් ලියන්න. (ලකුණු 02)

ii. ඔබ ලියූ කවි පාද දෙක ගැමි හා සේ ගී යටතේ බෙදා දක්වන්න. (ලකුණු 02)

iii. ගැමි ගී හා සේ ගී කෙටියෙන් හඳුන්වා, අසාත්මක හා අනාසාත්මක ගීයක් බැගින් උදාහරණ සපයන්න. (ලකුණු 04)

iv. දොළොස්මස් සේ ගීයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

05. පහත සඳහන් නාට්‍ය ගීත උපයෝගී කර ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

a. රතදර සිරි පරදන

b. පළමුව අප වැන්ද බුදුන්

c. අපෙ මුණිසඳ එදරී බලෙන්

d. රස බොජුනක් නැතත්

1. i. ''පළමුව අප වැන්ද බුදුන් '' යන ගීතය ගායනා කරන චරිතයක් නම් කරන්න. (ලකුණු 01)

ii. අබුද්දස්ස කෝලම නාට්‍යයට අදාළ ගීතය වන්නෙ මින් කුමන ගී පාද යද ? (ලකුණු 01)

iii. අන්දරේලා නාට්‍යයේ ඇතුළත් ගීත ඛණ්ඩය තෝරා ලියන්න. (ලකුණු 01)

iv. රතදර සිරි පරදන ගීතයඇතුළත් වන්නෙ ............................ නාට්‍යයේය. (ලකුණු 01)

2. i. නූතරී සහ නාඩගම් නාට්‍ය සම්ප්‍රදායේ සංගීතමය ලක්ෂණ සංසන්දනාත්මකව ලියන්න. (ලකුණු 04)

ii. ඔබ උගත් නූතරී ගීතයක ස්ථායී කොටසෙහි ගී පද ප්‍රස්තාරගත කරන්න.

(ලකුණු 04)

06. ග ම ප/ ග  ම රි /ස - - / - - - /
ම ම ම/ -  ග රි / ස  - - / - - - /

i. ඉහත දක්වා ඇති ස්වර ප්‍රස්තාරය බටහිර රේඛා මණ්ඩලය මත ප්‍රස්තාර කරන්න. (ලකුණු 04)

ii. ඉහත ස්වර ප්‍රස්ථාරය මධ්‍යම භාවයට පෙරළා නැවත ලියන්න.. (ලකුණු 04)

iii. පහත දැක්වෙන බටහිර සංකේත හඳුන්වා නම් ලියන්න.

1. ·|·   2. 𝄋   3. 3/4   4. 𝄞   (ලකුණු 04)

07. පහත සඳහන් සංගීතඥයන් අතුරින් තුන්දෙනෙකු පිළිබඳව ඔවුන්ගෙන් සංගීත ක්ෂේත්‍රයට සිදු වූ සේවය විවරණය වන පරිදි කෙටි සටහන් ලියන්න.

1.ඩබ්.ඩී.මකුලොලුව මහතා

2.පණ්ඩිත් රවිශංකර්

3.ලුඩ්විග් වැන් බීතෝවන් සංගීතඥයා

4.රෝහණ බැද්දගේ මහතා

5.යානී සංගීතඥයා

( ල.4 X 3 = 12)

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப்பதிப்புரிமையுடையது / All Rights Reserved]

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම - 2023

11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය | I පත්‍රය | පැය 01

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| **(1)** | 3 | (11) | 4 | (21) | 1 | (31) | 2 |
| **(2)** | 1 | (12) | 4 | (22) | 4 | (32) | 2 |
| **(3)** | 2 | (13) | 1 | (23) | 1 | (33) | 3 |
| **(4)** | 4 | (14) | 2 | (24) | 4 | (34) | 1 |
| **(5)** | 1 | (15) | 1 | (25) | 4 | (35) | 4 |
| **(6)** | 3 | (16) | 3 | (26) | 4 | (36) | 2 |
| **(7)** | 1 | (17) | 4 | (27) | 2 | (37) | 4 |
| **(8)** | 1 | (18) | 1 | (28) | 2 | (38) | 1 |
| **(9)** | 2 | (19) | 2 | (29) | 1 | (39) | 2 |
| **(10)** | 3 | (20) | 3 | (30) | 4 | (40) | 4 |

[සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

**මතුගම අධ්‍යාපන කලාපය**

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மதுகம கல்வி வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மதுகம கல்வி வலயம்

## දෙවන වාර ඇගයීම - 2023

| 11 ශ්‍රේණිය | පෙරදිග සංගීතය | II පත්‍රය | පැය 01 |
|---|---|---|---|

## පිළිතුරු

01.i.භූපාලි රාගය ii.ආවර්තය iii. acidpro, Abode Audition, Sound froge මේ ඕනෑම පිළිතුරක් සඳහා iv.පෘතුගීසීන්ගේ කාලයේදී

v.රත්නපුර vi.ධ්වනි ගුණ නිසා vii. ·//. viii.ඒ.ආර්.රහුමාන්

ix.සංගීත සම්භවය දැනට වළලු x.රවි ශංකර් යානි

02. i. A)භෛරවි රාගය B)යමන් රාගය C)කාෆි රාගය (ල. 03)
    ii. නිවැරදිව අදාළ ස්ථායී කොටස
    iii. නිවැරදි තානාලංකාර දෙකකට

03. A. දීප්චන්දි B. කෙහෙර්වා C. කෙම්ටෝ D.ත්‍රිතාලය (ල. 04)
    ii. දීප්චන්දි තාලය නියමිත තාල සංඥා සහිතව ප්‍රස්තාර කිරීම. (ල. 03)
    iii. යලුනෙළුම්/ අද වෙස්සන්තර/ පාන්කිරිත්තා 6/8 තාලයට ගැළපෙන ඕනෑම ගීතයක් (ල. 01)
    iv. මහ තනි තිත

| / | | | | / | | | | / | | | | / | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 | 10 | 11 | 12 | 13 | 14 | 15 | 16 |
| දො | දො | ං | ත | ත | කු | දො | ං | ත | දො | ං | දො | මි | ත | දො | ං |

04. i. a. කොහොවියනා හඩ නඟනා
    b. අහසට පිඹිනා එරන් කළේයා (ල. 02)
  ii. a. තේ ගී
    b. ගැමි ගී (ල. 02)
  iii. නිවැරදි හැඳින්වීමට හා උදාහරණ නිවැරදිව ලිවීම (ල. 04)
  iv. නිවැරදි ප්‍රස්ථාරයට (රුගත් සුරා, සඳවා සුදු ආදී කවි) (ල. 04)

05. i. ජැංඩි සිංඤෝ (ල.1) ii. අපෙ මුණි සඳ (ල.1) iii. රස බොජුනක් (ල.1) iv. කුස පබාවතී (ල.1) (ල. 04)

. i. නූර්ති/ නාඩගම් සංගීතමය ලක්ෂණ ලිවීම සඳහා (ල. 04)

iii. නූර්ති ගීතය ලිවීම සඳහා (ල. 04)

06. i. නිවැරදිව රේඛා මණ්ඩලය මත ස්වර ලකුණු කිරීම (ල. 4 )

ii. ධ <u>නි</u> ස | ධ <u>නි</u> ප | ම - - | - - -
<u>නි</u> <u>නි</u> <u>නි</u> | - ධ ප | ම - - | - - - (ල. 4 )

iii. (1) ·| ·රිපිටේෂන් මාර්ක් (2) 𝄋 සගින් වූ සයින් මාර්ක්
( 3) 3/4 ටයිම් සිග්නේචර් (4) 𝄞 ට්‍රිබල් කෙලෙප් (ල. 4)

07. සංගීතඥයින් තිදෙනෙකු ගැන කෙටි සටහන් බලාපොරොත්තු වේ. (ල. 4 x 3 = 12)



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න